**ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය.**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1:1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) 2011 වර්ෂයේ අමාත්‍යාංශයෙන් ලැබූ පරිඝනක 30 ක්, පරිඝනක පුටු 25 ක් හා තවත් වත්කම් අයිතම 34 ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි .

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් කටයුතුවලින් රු.5,340,626 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,581,136 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,921,762 ක පිරිහීමක් සඳහා වර්ෂයේ ලැබීම් රු. 7,133,828 කින් අඩුවීම හා සමස්ථ වියදම රු.787,934 කින් වැඩිවීම හේතුවී තිබුණි.

## 3. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව 2012 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර 2012 වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා වූ කාලය පමණක් ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි.

## 4. පද්ධති හා පාලනය

විගණනයේදි නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගිණුම්කරණය

(ආ) සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම